# ලංසු සඳහා ආරාධනාවයි

## දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගාල්ල

### ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩ සටහන

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වන මා විසින් පහත කාර්යය සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | විස්තරය | අවම ලියාපදිංචිය | ඉංජිනේරු ඇස්තමේන්තු මුදල රු. | ආපසු නොගෙවන ලද ලංසු කැප්පත් මුදල රු. | ලංසු සුරක්ෂණය රු. |
|---|---|---|---|---|---|
| 01 | ගොනාමුල්ල රණසිංහවත්ත මාර්ගය කාර දමා සංවර්ධනය කිරීම | C- 8 | 2,385,740.60 | 1,350.00 | 30,000.00 |

කොන්ත්‍රාත් කාලය 2018 දෙසැම්බර් 15 දක්වා වේ.

02 සීමිත මිල ගණන් කැඳවීම යටතේ ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරේ.

03 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මඟින් වර්ග කරනු ලැබූ රජයේ වැඩ සඳහා ලියාපදිංචි,ඉහත වගුවේ දැක්වෙන ශ්‍රේණිය හා අදාල, අසාධු ලේඛණගත නොවූ,ව්‍යාපාර ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත්තුව ලබා ගැනීමට සුදුසුකම් ඇත.

04 ලංසුකරුවන් සම්බන්ධ වැඩි විස්තර වැඩ කරන දිනයන්හි සාමාන්‍ය රාජකාරි වේලාවන්හිදී ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ(ක්‍රමසම්පාදන) වෙතින් ලබාගත හැකිය. දුරකථන අංකය -091-2222975

05 මේ සම්බන්ධ උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට 2018.10.12 දින සිට 2018.10.22 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.09.00 සිට ප.ව.3.00 දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කරන ලද ලංසු ලේඛණ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 07 වන මහලේ පිහිටි සැළසුම් අංශයෙන් නිකුත් කරනු ලබන අතර, ඉහත වගුවේ පරිදි එක් එක් ව්‍යාපෘතිය සඳහා නැවත නොගෙවන ලංසු මුදල් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2 වන මහලේ සරප් වෙතින් ගෙවීම කිරීමෙන් ලබාගත් රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සිදු කෙරේ.

06 2018/10/23 දින ප.ව.2.00 දක්වා මුද්‍රා තබන ලද ලංසුපත් භාරගනු ලබන අතර ලංසුපත් භාර ගැනීම අවසන් වූ විගස ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරියේ ලංසුපත් විවෘත කරනු ලැබේ.

07 ඉදිරිපත් කරන ලංසු,ලංසු විවෘත කළ දිනයේ සිට දින 63ක කාලයක් සඳහා වලංගු විය යුතු අතර ලංසු සුරක්ෂණය එදින සිට දින 28ක කාලයක් වන 2019/01/21 දින දක්වා වලංගු විය යුතුය.

08 සෑම ලංසුවක්ම ලංසු ලියවිලිවල දක්වා ඇති ආයතන වෙතින් ලබාගත් ව්‍යාපෘතියකට අදාලව වගුවේ දක්වන ලද ලංසු සුරක්ෂණයක වටිනාකමට සමාන ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
ගාල්ල පරිපාලන දිස්ත්‍රික්කය.